**ශීර්ෂය 201 - බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව.**

---------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජුනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මග හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවවිසින් ඉකුත් වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව ප්‍රකාශ කළ නොහැකිවිය.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| (i) මහනුවර බෞද්ධ කටයුතු කොමසාරිස් නිල නිවසේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2016 වර්ෂයේ දී හා 2017 වර්ෂයේදී පිළිවෙලින් රු.4,500,000 ක් හා රු.8,000,000 ක් වැය කර තිබුණු අතර එම වියදම් කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නොනිමි වැඩ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි මූල්‍ය නොවන වත්කම් ලෙස දැක්විය යුතු වීම | ඉදිකිරීම් 2019 වර්ෂයේදී අවසන් කර ඇති බැවින් ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරන අතර කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නැත. |
| (ii) දේපළ, පිරියත හා උපකරණවල 2018 ජනවාරි 01 දිනට ශේෂය රු.64,325,314 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි 2017 වර්ෂයේ අනුරූපී සංඛ්‍යා දැක්වීමේ දී එය රු.12,650,267 ක් ලෙස දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මකභාවය තහවුරු කිරීම සඳහා අනුරූපී සංඛ්‍යා නිවැරදිව හෙළිදරව් කළ යුතු වීම | දේපළ, පිරියතවල 2017 වර්ෂයේ අනුරූපි සංඛ්‍යාව රු.64,325,314 ක් විය යුතුය |

**1.6.2 තැන්පතු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| දේවාලවල භාරකරුවන් විසින් දෙපාර්තමේන්තුවෙහි තබන ලද ඇප මුදල්වලින් සමන්විත රු.6,832,155 ක ශේෂය වූ ජංගම ගිණුමක් 2017 දෙසැම්බර් 29 දින අවසන් කර පොදු තැන්පත් ගිණුමට මාරු කර තිබුණි. ඉන් රු.477,250 ක් සඳහා පමණක් සමාලෝචිත වර්ෂයේ දී අදාළ ඇපකරුවන් හඳුනාගෙන තිබුණද, රු.6,354,905 ක් සඳහා ඇපකරුවන් හඳුනාගෙන ඔවුන්ගේ නමින් තැන්පත් නොකර පොදු තැන්පත් ගිණුමෙහි රඳවාගෙන තිබුණි. | ඇපකරුවන් හඳුනාගෙන ඔවුන්ගේ නමින් තැන්පත් කළ යුතු වීම. | තැන්පත් ගිණුමට බැරකර නිරවුල් කිරීමට ඇති රු.6,354,905 ක මුදල අදාලවන භාරකරුවන් හඳුනාගෙන නිරවුල් කිරීමේ කටයුතු සිදුකරන අතර 2019 දෙසැම්බර් 31 දින වනවිට අවසන් කිරීමට සැලසුම් කර ඇත. |

### 1.6.3 අත්තිකාරම් ගිණුම් ශේෂ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| භාණ්ඩාගාර පොත් අනුව අත්තිකාරම් ගිණුමේ ශේෂය, 2018 ජනවාරි 01 දිනට රු.57,477,285 ක් හා 2018 දෙසැම්බර් 31 දිනට රු.57,045,008 ක් වුවද, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි එය පිළිවෙළින් රු.56,475,007 ක් හා රු.55,325,894 ක් ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාර චක්‍රලේඛ උපදෙස් අනුගමනය කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. | මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී හරස් සටහන් මඟින් ගිණුම්ගත කරනු ලබන වටිනාකම ප්‍රමාද දෝෂයකින් ඇතුලත්කර තිබී නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් පුනරාවර්තන වැය විෂයන් 11 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 4ක් සඳහා සලසාගෙන තිබුණු මුළු ප්‍රතිපාදනයෙන් රු.131,579,634 ක් හෙවත් සියයට 6 සිට සියයට 80 දක්වා වූ පරාසයකට අයත් ප්‍රතිපාදන ඉතිරිකර තිබුණි. | අවශ්‍යතාවය නිසි පරිදි පුරෝකථනය කර අරමුදල් ප්‍රශස්ත මට්ටමින් උපයෝජනය කළ යුතු වීම. | අපේක්ෂිත වියදම් ඇති නොවීම, ඇණවුම් කරන ලද භාණ්ඩ නොලැබීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන භාවිතා නොකිරීම ආදී හේතු මෙම ඉතිරිවීම්වලට බලපාන ලදී. |

### 2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 94(I)ට පටහැනිව ගුරු දීමනා වැය විෂයය සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් ඉතිරි වූ රු.18,156,509 ක් ඉක්මවා රු.3,221,491කින් වැඩිපුර බැරකම්වලටඑළඹ තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන සීමාව තුල වියදම් හෝ බැඳීම් ඇති කර ගත යුතු වීම. | මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාරව කටයුතු කර ඇත. |

**2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අවස්ථා 20 කදී ලබා දෙන ලද රු.347,500 ක් වූ අත්තිකාරම්වලට අදාළ ඉතිරි මුදල් පියවීමේ දී දින 4 සිට දින 28 දක්වා කාලයක් ගත වී තිබුණි. | අත්තිකාරම් ලබාදීමේ හා පියවීමේ කටයුතු විධිමත්ව අධීක්ෂණය කළ යුතු වීම. | විමසුමේ සඳහන් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා නැවත ලිඛිත උපදෙස් ලබාදෙමි. |
| (ආ) අවශ්‍යතාවය නිසි ලෙස අධ්‍යයනය කිරීමෙන් තොරව අත්තිකාරම් ලබාදීම හේතුවෙන් ලබා දෙන ලද අත්තිකාරම්වලින් රු.141,195 ක් එනම් සියයට 23 සිට සියයට 55 ක් දක්වා වියදම් නොවී නැවත පියවා තිබුණි. | අවශ්‍යතාවය නිසි පරිදි අධ්‍යනය කර අත්තිකාරම් ලබා දිය යුතු වීම. | විමසුමේ සඳහන් අඩුපාඩු නිවැරදි කිරීම සඳහා නැවත ලිඛිත උපදෙස් ලබාදෙමි. |

**3. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| "තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාළව දෙපාර්තමේන්තුව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් අදාළ වන තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද, ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගෙන නොතිබුණි. | තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රයේ අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතු වීම. | ඉලක්ක, එම ඉලක්ක කරා ළගා විය යුතු සංධිස්ථානයන්ද, ඉලක්ක මත මැණ බැලීම් සඳහා වන දර්ශකයන් හදුනා ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ සියලු නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් වැඩමුළු දෙකක් පවත්වා ඇති අතර, එම වැඩමුළුවලින් යෝජනා වී ඇති දර්ශකයන් සකස් කරමින් පවතී. |